# ඇමරිකා එක්සත් ජනපදයේ බීටා ඇනලටික් ආයතනය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල නීලගිරි ස්තූපයට ලබාදී ඇති කාබන් 14 (C 14) දිනවකවානුවල නිරවද්‍යතාව පිළිබඳ විශ්ලේෂණාත්මක හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

රුසිරි කසුන් නානායක්කාර[1]

## හැඳින්වීම

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් අංශය මගින් 2011 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි නීලගිරි ස්තූපයේ කැණීම් ආරම්භ කරන ලදි (නීලගිරි කැණීම් වාර්තාව II කොටස,2016:පිටු 2). 2011 වසරේ ආරම්භවූ මෙම ස්තූප කැණීම් ව්‍යාපෘතිය 2014 වසරේ සැප්තැම්බර් මස 31 වැනි දින දක්වා පැවතුණි. මෙම කැණීමෙන් කංචුකය තුළ නිර්මාණය කර තිබූ ධාතු කුටීර 31 අයත් පුරාවස්තු රැසක් හමුවිය (නීලගිරි කැණීම් වාර්තාව II කොටස, 2016, පිටු:5). මෙම කැණීම් ව්‍යාපෘතිය මගින් නීලගිරිය ස්තූපයේ ධාතු ගර්භය කැණීම සිදු නොකළ අතර ගරා වැටී තිබූ පස් ගොඩැල්ල ඉවත් කිරීමේදී මෙම සුවිශාල පුරාවස්තු එකතුව හමුවිය. නීලගිරිය ස්තූපය කැණීමෙන් හමුවූ පුරාවස්තු අතරින් ධාතු කරඬු 400ක්ද, පබළු 24000ක්ද, කාසි 70ක්ද, මැටි මංජුසා 15ක්ද, මැටි පාත්‍ර 12ක්ද, තඹ පාත්‍ර 4ක්ද, යකඩ පාත්‍ර 2 ක්ද හමුවිය (නීලගිරි කැණීම් වාර්තාව II කොටස,2016, පිටු:4).

මෙම කැණීමෙන් හමුවූ සියලුම පුරාවස්තු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරය තුළ විශ්ලේෂණ කටයුතු 2015 වසරේ සිදුකරන ලදී. හමුවූ සියලුම පුරාවස්තු සංසිද්ධිගත අංක (Context No) 17 සිට 57 දක්වා නම් කරන ලදි (නීලගිරි කැණීම් වාර්තාව II කොටස, 2016, පිටු:1). මෙම සියලුම පුරාවස්තු කංචුකය තුළ ඉදිකළ ධාතු කුටීර තුළ තිබී හමු විය. සංසිද්ධිගත අංක 43 ( Context No 43 ) ලෙස නම් කරන ලද ධාතු කුටීරය තුළ තිබී හමුවූ මැටි මංජුසාවක තැන්පත්කර තිබූ පියන සහිත තඹ මංජුසාවක මධ්‍යයේ 2 cm පමණ දිගින් සහ 1 cm පමණ පළලැති දැඩි ලෙස විනාශයට ලක්වෙමින් පැවති දැව කැබැල්ලක් හමු විය (නීලගිරි කැණීම් වාර්තාව II කොටස, 2016, පිටු:55). එම දැව කැබැල්ල 2015 වසරේදී කැණීම් අංශය මගින් ඇමරිකාවේ බීටා ඇනලටික්

---

[1] කැණීම් අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ආයතනය වෙත ලබාදුන් අතර ඒ අනුව එම ආයතනය මගින් සිදු කළ පර්යේෂණ මගින් එම දැව කැබැල්ල ක්‍රි.ව 70-230ත් අතර කාලයට අයත් බවට තහවුරු විය (නීලගිරි කැණීම් වාර්තාව II කොටස, 2016: පිටු 3). මේ අනුව නීලගිරි ස්තූපයේ පුරාවස්තු අයත් කංචුකය ක්‍රි.ව 70-230 අතර කාලයට අයත් බවට නිගමනය කරන ලදී. කෙසේ නමුත් එම දැව කැබැල්ල ක්‍රි.ව 70-230 අතර කාලයට අයත් වුවද නීලගිරි ස්තූපය එම කාලයට අයත් බවට වූ පිළිගැනීම ඇතැම් උගතුන් බැහැර කරන ලදි. මේ නිසා ඇමරිකාවේ බීටා ඇනලටික් ආයතනය මගින් ලබාදුන් එම දිනවකවානු වෙනත් ක්‍රමවේදයක් යටතේ තහවුරු කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වේ.

## පර්යේෂණ ගැටළුව

2015 නීලගිරි ස්තූප කැණීමෙන් හමුවූ පුරාවස්තු විශ්ලේෂණ ව්‍යාපෘතිය අතරතුරදී හමුවූ සංසිද්ධිගත අංක 43ට අයත් තඹ මංජුසාවක තිබී හමුවූ දැව කොටස විශ්ලේෂණය කළ බීටා ඇනලටික් ආයතනය මගින් ලබාදුන් නිශ්චිත දිනවකවානු පිළිගත හැකිද?

## පර්යේෂණ ක්‍රමවේද

මෙහිදී ප්‍රධාන වශයෙන් බීටා ඇනලටික් ආයතනය මගින් ලබාදුන් කාබන් 14 දත්ත අධ්‍යයනය කිරීම. නීලගිරි ස්තූප කැණීමෙන් හමුවූ අනෙකුත් පුරාවස්තු අධ්‍යයනය කිරීම සහ වෙනත් ස්තූප කැණීම් වලින් හමුවූ පුරාවස්තු සමග සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම.

## පර්යේෂණ අරමුණ

ලාහුගල නීලගිරි ස්තූපයට බීටා ඇනලටික් ආයතනය විසින් ලබාදී ඇති නිශ්චිත දිනවකවානු නිවැරදි බව සනාථ කිරීම.

ලාහුගල නීලගිරි ස්තූපයේ සංසිද්ධිගත අංක 43ට අයත් ධාතු කුටීරය හමුවූයේ $H_2$ කැණීම් පරිශ්‍රය තුළිනි (නීලගිරි කැණීම් වාර්තාව II කොටස, 2016, පිටු:55). මැටි මංජුසාව කොටස් දෙකකින් යුක්තවූ අතර එහි පිටතවූ බඳුන සම්පූර්ණයෙන්ම කැබලි වලට කැඩී විනාශ වී තිබූ අතර ඇතුළත මංජුසාව යම් පමණකින් ආරක්ෂා වී තිබුණි. මෙම මංජුසාව විවෘත කිරීමේදී ඒ තුළ පියන සහිත තඹ මංජුසාවක්, පළිඟු කරඬු 3ක් සහ රන් පැහැති කැබලි කිහිපයක් තිබුණි. මෙම මැටි මංජුසාව තුළ ඉතා ක්‍රමවත්ව තැන්පත්කර තිබූ තඹ මංජුසාවක් තුළ එහි මධ්‍යයේ 2cm පමණ දිගින් 1cm පමණ පළලැති දැව කොටස හමුවිය. එම දැව

කොටස විශ්ලේෂණය කළ බීටා ඇනලටික් ආයතනය එය ක්‍රි.ව 70-230 අතර කාලයට අයත් බවට තහවුරු කරන ලදී. නමුත් එම දිනවකවානු ඇතැම් පුරාවිද්‍යාඥයන් සහ ඉතිහාසඥයන් ප්‍රතික්ෂේප කරන අතර ඔවුන්ගේ මතය වනුයේ එම පුරාවස්තු සහිත කංචුකය ක්‍රි.ව 5 වන සියවසට පමණ අයත් බවයි. මෙම ගැටළුව නිරාකරණය කළ හැක්කේ නීලගිරි ස්තූපයෙන් හමුවූ පුරාවස්තු විශ්ලේෂණාත්මකව සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් පමණි.

මේ අනුව නීලගිරි ස්තූප කංචුකය තුළින් අපර බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපි 2ක් හමුවිය. එක් ලිපියක් ධාතු කුටීරයක් අසල තිබී හමුවිය (කොඩිතුවක්කු, 2015, පිටු:15). අකුරක් 5cm – 7cm පමණ ප්‍රමාණයෙන් යුතු මෙම ලිපියේ පේළි තුනක් සහ අක්ෂර නවයකින් සමන්විත වේ. අපර බ්‍රාහ්මී අක්ෂරයෙන් යුක්ත මෙම ලිපිය ක්‍රි.ව 1-2 සියවස් වලට පමණ අයත් බව එම ලිපියේ අක්ෂර අධ්‍යනය කිරීමෙන් තහවුරුවේ (කොඩිතුවක්කු, 2015, පිටු:15). ''ස්වාමි නාගගේ පාෂාණ'' යනුවෙන් එහි දක්වා ඇත (කොඩිතුවක්කු, 2015, පිටු:16). මීට අමතරව සංසිද්ධිගත අංක 54ට අයත් ධාතු කුටීරය තුළ තිබූ මැටි මංජුසාවක පියනේ ඇතුළත පෘෂ්ඨයේ අපර බ්‍රාහ්මිය අක්ෂරයෙන් 'මළි' ලෙස සඳහන්කර ඇත (නීලගිරි කැණීම් වාර්තාව II කොටස, 2016, පිටු:160). මෙහි සඳහන් මළි යනු ක්‍රි.ව 164-192 කාලයේ රාජ්‍ය කළ කණිට්ඨ තිස්ස රජු විය හැක. මක්නිසාදයත් මළිතිස, මළුතිස ලෙස ඔහුගේ නාමය සෙල්ලිපිවල සඳහන් බැවිනි (පාකර්, 2008, පිටු:368). එමෙන්ම මෙහි තිස ලෙස සඳහන් පෙළ මැකී යන්නට ඇත. කෙසේ නමුදු මෙම අක්ෂර ක්‍රි.ව 2 සියවස්වලට අයත්වේ.

නීලගිරි ස්තූපයෙන් හමුවූ නාණක විද්‍යා සාධක මගින්ද එම ස්තූපය ක්‍රි.ව 1-2 සියවස්වලට අයත් බවට තහවුරු වේ. විශේෂයෙන් ක්‍රි.ව 1,2,3 සියවස්වල මෙරට භාවිතයේ පැවති බවට විශ්වාස කළ හැකි ලක්ෂ්මී කාසි 51ක් නීලගිරි ස්තූපයෙන් හමුවීමද මෙකී ස්තූපය එම කාලයට අයත් බවට තහවුරු කළ හැකි තවත් සාධකයකි.

එමෙන්ම නීලගිරි ස්තූපයෙන් ධාතු කරඬු 400ක් පමණ හමුවී ඇති අතර එම ධාතු කරඬු, ක්‍රි.ව 2වන සියවසේ කණිට්ඨතිස්ස නිර්මාණය කළ බවට තහවුරු වී ඇති අභයගිරි දකුණු වාහල්කඩ කැණීමෙන් හමුවූ ධාතු කරඬු, රුවන්වැලිසෑය වාහල්කඩෙන් හමුවූ ධාතු කරඬුවලටද එමෙන්ම දීඝවාපී ස්තූප කැණීමෙන් හමුවූ රන් කරඬුව සහ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් නීලගිරි ස්තූපයේ හමුවූ ධාතු කරඬු බොහෝ සෙයින්ම සමාන බවට පැහැදිලි වේ (Paranavitana,1947: pp 16-17).

මේ අනුව අපට නිගමනය කළ හැක්කේ ලාහුගල නීලගිරි ස්තූපයෙන් හමුවූ දැව කොටස විශ්ලේෂණය කර බීටා ඇනලටික් ආයතනය මගින් ලබාදී ඇති දිනවකවානු නිවැරදි බව එම කැණීමෙන් හමුවූ පුරාවස්තු අධ්‍යයනය කිරීමෙන් තහවුරු වන බවයි.

ප්‍රමුඛ පද : නීලගිරිය, ස්තූප, දිනවකවානු, කරඬු, පුරාවස්තු

ආශ්‍රිත ග්‍රන්ථ

කුලතුංග,ටී.ජී.(2015). *අභයගිරිය විහාරය.* මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

කොඩිතුවක්කු, එන්. (2015). *අභිලේඛන පර්යේෂණ සංග්‍රහය.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

*නීලගිරි සෑය කැණීම් වාර්තාව II* කොටස (පුරාවස්තු විශ්ලේෂණය). (2016). කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පාකර්, එච්. (2008). *පුරාණ ලංකාව* (Ancient Ceylon. (පරි.) පෙරේරා, නිස්සංක, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Paranavithana, S. (1947). *Report on the Archaeological Survey of Ceylon for 1945-46*, Government Press.